# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1500/20 – 2007 ජුනි 06 වැනි බදාදා – 2007.06.06

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**2005 අංක 06 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 අ වගන්තිය යටතේ පනවනු ලබන නියමය**

2005 අංක 06 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 අ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත උපලේඛනයේ I වැනි හා II වැනි තීරුවල සංයෝජිත වර්ගීකරණ සංකේත හා විස්තරයෙහි සඳහන් කරන ලැබ ඇති භාණ්ඩ ආනයනය මත, එම උපලේඛණයේ III වැනි තීරුවේ ඊට අනුරූපීව සඳහන් කර ඇති නිශ්චිත අනු ප්‍රමාණය අනුව එකතු කළ අගය මත බදු ගෙවිය යුතු බව මෙම නියමය මගින් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය

2007 ක් වූ ජුනි මස 05 වැනි දින,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

| *I* | *II* | *III* |
|---|---|---|
| *සංයෝජිත වර්ගීකරණ සංකේතය* | *විස්තරය* | *බදු අනු ප්‍රමාණය* |
| 1604.11 | සැමන් | 5% |
| 1604.12 | හුරුල්ලන් | 5% |
| 1604.13 | සාඩින්, සාඩිනෙල්ලා සහ බ්‍රිස්ලින් හෝ හාල්මැස්සන් | 5% |
| 1604.14 | ඇටවල්ලා, ස්කිප්ජැක් සහ බොනිටෝ (සර්ඩා විශේෂයේ) | 5% |
| 1604.15 | මැකරල් | 5% |
| 1604.16 | ඇන්චෝවිසි | 5% |
| 1604.19 | අනෙකුත් | 5% |
| 0713.20 | කොණ්ඩ කඩල (ගාර්බන් සෝස්) | 5% |
| 0713.31.01 | මුං ඇට | 5% |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.